ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමය
ஸ்ரீ லங்கா நிருவாக சேவைச் சங்கம்
SRI LANKA ADMINISTRATIVE SERVICE ASSOCIATION

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My Ref. | SASA/2022/A/35 | ඔබේ අංකය<br>உமது இல.<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2022.05.10 |

**සභාපති**

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**<u>ගාලුමුවදොර පිටිය සහ අරලියගහ මන්දිරය අසල සාමකාමී ලෙස සිදුකළ විරෝධතාවට ප්‍රහාර එල්ල කිරීම හේතුවෙන් විරෝධතාකරුවන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් පැමිණිලි කිරීම</u>**

ඊයේ (2022-05-09) දින අරලියගහ මන්දිරයට ඒකරාශී වූ පිරිසක් ඒ ඉදිරිපිට හා ගාලු මුවදොර සාමකාමී විරෝධතා දක්වමින් සිටි මහජනතාව ඉලක්ක කොට ගෙන දියත් කරන ලද ම්ලේච්ඡ ප්‍රහාරය හේතුවෙන් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති සාමකාමී රැස්වීමේ, භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ද වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලට ලක්නොවී සිටීමේ නිදහස ඇතුළු මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇති අතර ඒ සම්බන්ධයෙන් පහත පාර්ශව වගකිව යුතු බව පැමිණිලි කර සිටිමු.

1) මෙවැනි තත්ත්වයක් ඇති වීමට අනියමින් අනුබල දීම හා පසුබිම සකස් කිරීම සම්බන්ධයෙන් හිටපු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා විසින් වගකීම භාරගත යුතුව ඇත.

2) මහජනතාව ආරක්ෂා කිරීමේ වගකීම පැහැර හැරීම සම්බන්ධයෙන් මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ පොලිස්පතිවරයා වගඋත්තරකරුවන් වේ.

3) 2022-05-09 දින අරලියගහ මන්දිරයට පිරිසක් කැඳවා ඔවුන් සංවිධානාත්මකව මහජනතාවට පහර දීම සඳහා පෙළඹවෙන ආකාරයේ ප්‍රකාශ නිකුත් කිරීම පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රී ජොන්ස්ටන් ප්‍රනාන්දු ද ප්‍රහාරය සිදු කරන අවස්ථාවේ සක්‍රියව ඒ සඳහා සහභාගී වීම පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රී සනත් නිශාන්ත සහ එම අවස්ථාවලට සහභාගී වූ පළාත් පාලන ආයතන ප්‍රධානීන්ද වගකිව යුතු වේ. (විශේෂයෙන්ම එම අවස්ථාව සඳහා පළාත් පාලන ආයතන ප්‍රධානීන් විසින් අදාළ ආයතනවල සේවකයන් බලහත්කාරයෙන් කැඳවා ගෙන පැමිණ මෙම ම්ලේච්ඡ ක්‍රියාව මෙහෙයවීමට කටයුතු කර ඇති බවද නිරීක්ෂණය වේ.)

4) එසේම බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් මෙම ක්‍රියාව සඳහා බන්ධනාගාර රැඳවියන් යොමු කර තිබූ බවද සමාජ ජාල හරහා සංසරණය වූ වීඩියෝ දර්ශන නැරඹීමේදී නිරීක්ෂණය වන අතර එමඟින් එම බන්ධනාගාර රැඳවියන්ගේ ද මූලික අයිතීන් කඩවී ඇති බව පෙන්වා දෙමු.

23 සී, සමුළු නිවාස, කැප්පෙටිපොල මාවත, කොළඹ 05. 23 சீ, சமிட் தொடர்மாடி,கெப்பிட்டிப்பொல மாவத்தை, கொழும்பு-05.
23C, Summit Flats, Keppetipola Mw., Colombo 05.
දුරකතනය/ தொலைபேசி/Telephone : 011 5766855 ෆැක්ස්/தொலைநகல்/ Fax : 011 2058027
විද්‍යුත් තැපැල/மின்னஞ்சல்/ Email : sasa.execo@gmail.com වෙබ් අඩවිය/இணையத்தளம்/ Web: www.sasa.lk

එබැවින් මෙම මිලේච්ඡ ක්‍රියාවට සම්බන්ධ වූ සහ ආධාර අනුබල දුන් සියලු පාර්ශව සම්බන්ධයෙන් වහාම විධිමත් පරීක්ෂණ පවත්වා නීතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ විධායක කමිටුව වෙනුවෙන්,

**පදුල ශ්‍රී රෝහණ ද සිල්වා**
ගරු සභාපති

**ප්‍රදීප් ලක්ශාන්ත**
ගරු ලේකම්